ආයතනයේ නම: **ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்: **விளையாட்டு மற்றும் இளைஞர் விவகார அமைச்சகம்**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்மவைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எருக்கப்டும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the Institution: **Ministry of Sports & Youth Affairs**

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of standing order No: 119(4)

ආකෘති අංක 01

පාර්ලිමේන්තු මාලාවේ අංකය: 183

ආයතනයේ නම: ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

| අනු අංකය | අඩු පාඩු හා දුර්වලතා | ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 01 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු ඉදිරිපත් කරන මෙන් සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇති අතර මේ පිළිබඳව ත්‍රෛමාසිකව පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ද සාකච්ඡා කර පසු විපරම් කිරීම සිදු කරයි. |
| 02 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021.03.30 දින වන විට විගණකාධිපති වෙත යොමු කර ඇති අතර භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌණතා පිළිබඳව වන සියලුම නිර්දේශද 2021.09.28 දින වන විට ක්‍රියාත්මක කර අවසන් කර ඇත. |
| 03. | වර්ෂයකට වඩා කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ රු.537,319.00ක් පැවති අතර මේ වන විට ඉන් රු.448,906.00ක ණය ශේෂ නිරවුල් කරඇති අතර ඉතිරි ණය ශේෂය වන රු.88,413.00ක ණය ශේෂය, එම විශ්‍රාම ගිය නිලධාරියාගෙන් මාසිකව රු.10,000.00 බැගින් විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ගනිමින් පවතී. |
| 04. | පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර 02කට වඩා වැඩි කල් ඉකුත් වූ තැන්පතු රු.23,658,883.83ක් 2020.12.31 දින වන විට පැවති අතර අද වන විට එම තැන්පතු වලින් රු.9,154,806.26ක් නිදහස් කර ඇත. ඉතිරි කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුකූලව කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| 05 | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්ථා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්ථාව ඉදිරිපත් කිරීමට 2021.06.30 දක්වා කාලය දීර්ඝ කර තිබූ අතර, පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ ජාතික විගණන කාර්යාලය විසින් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති වාර්ථාව 2021 නොවැම්බර් 22 දින ලබා දුන් බැවින් 2021.06.30 දිනට පෙර වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.<br>කාර්ය සාධන වාර්ථා පොත් 300 මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණාලය විසින් සිදු කරන ලද අතර පැවති කොවිඩ් වසංගතය හමුවේ මෙම මුද්‍රණ කටයුතු ප්‍රමාද වීම නිසා |

| | | |
|---|---|---|
| | | මුද්‍රණාලයෙන් පොත් 300 ලැබුණු පසු වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022.01.19 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01) |
| 06 | පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි | පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි සකස් කර ඇත. (ඇමුණුම 02) |
| 07 | ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | අංශ රැස්වීම් වලදි හා මාණ්ඩලික නිලධාරි රැස්වීම් වලදී පුරවැසි ප්‍රඥප්තිය හා සේවාලාභි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරිමට කටයුතු සිදුකරමින් පවතියි. |

ආකෘති අංක 01

පාර්ලිමේන්තු අනුක්‍රමික අංකය : 183
ආයතනයේ නම : ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**පළමු කොටස : 90.**

| අනු අංකය | අඩු පාඩු හා දුර්වලතා | ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 01 | මු.රෙ.91(1) ප්‍රකාරව වැය විෂයකට සලකා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි. | දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ඇස්තමේන්තු ගත මුදල රු.මිලියන 344 ක් වුවද භාණ්ඩාගාරයෙන් රු.මිලියන 250 ක් පමණක් වෙන්කර තිබිණි. එය ප්‍රමාණවත් නොවන නිසා ජාතික ඔලිම්පික් කමිටුව වෙත භාණ්ඩාගාරයෙන් දෙන බවට එකඟ වී තිබූ රු.මිලියන 100 ක් නොලැබීම නිසා මෙම සීමාව ඉක්මවී ඇත. මෙය ජාත්‍යන්තර තරඟාවලියක් වූ හෙයින් ක්‍රීඩා කණ්ඩායම් සහභාගී කරවීම අත්‍යාවශ්‍ය කටයුත්තක් වූ හේතුවෙන් මෙම වියදම් සීමාව ඉක්මවා දැරීමට සිදු වී ඇත.<br><br>ඉදිරියේදී බැදීම් වලට එළඹීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| 02 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි | • මෙම ණයකරු මිය යන විට මෙම නිලධාරියාගේ සේවා කාලය අවුරුදු 05කට අඩු බැවින් පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට නොහැකි වී ඇති අතර පෞද්ගලික ලිපිගොනුව ලේඛනාගාරයේ සොයාගැනීමට නොමැති බැවින් ඇපකරුවන් පිළිබඳව තොරතුරුද සොයාගැනීමට නොහැකි වී ඇත. එම නිසා ණය අයකර ගැනීමට නොහැකි වී ඇත.<br><br>එබැවින් මු.රෙ.104,105 ප්‍රකාරව නැතිවීම්/හානිපාඩු සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකිරීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතියි.<br><br>• සේවය අතහැර ගිය මෙම නිලධාරියාට අදාළ ණය මුදල ගෙවන ලෙස ඔහුගේ භාර්යාව සේවය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ප්‍රාදේශීය ලේකම් මගින් දන්වා යැවීමට කටයුතු කළද අදාළ ණය මුදල එම නිලධාරිනියගේ වැටුපෙන් අය කර එවීමට නොහැකි බව ප්‍රාදේශීය ලේකම් ලිඛිතව මා වෙත දන්වා ඇත. තවද මෙම නිලධාරියාගේ ණය ගොනුව ලේඛනාගාරයේ නොමැති බැවින් ඇපකරුවන්ගේ තොරතුරු සොයාගැනීමට නොමැත.<br><br>එබැවින් මු.රෙ.104,105 ප්‍රකාරව හානිපාඩු සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකිරීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතියි. |

| | | |
|---|---|---|
| 03 | පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2020.12.31 දිනට තැන්පතු ගිණුමේ පැවති රු.26,073,735 ක් වූ තැන්පතු 55 න්, 2021.12.31 දින වන විට තැන්පතු නිදහන් කර ඉතිරිව ඇති , තැන්පතු 34 කට අදාළ තැන්පතුවල ශේෂය රු.13,436,191.71 වේ. (ඇමුණුම 03)<br><br>මෙම තැන්පතු ඉදිකිරීම්වලට අදාළ රඳවුම් මුදල් වන අතර එම මුදල් ඉංජිනේරු නිර්දේශය අනුව ඉදිරියේදී ගෙවීමට සිදුවන බැවින් රජයේ අදායමට බැර නොකරන ලදී. කෙසේ නමුත් ආපසු ගෙවීමට සිදු නොවන තැන්පතු මු.රෙ.570 ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| 04 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 371 පරිදි කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ වන විට මෙවැනි ප්‍රමාද වීම් නොමැත. |

දෙවැනි කොටස **:68.00**

| | | |
|---|---|---|
| 05 | පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය 2022.03.28 දින අනුමත කර ඇති අතර, එදින සිට ක්‍රියාවට නංවා ඇත. |
| 06 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිණුම් ගතව නොතිබුණි. | සමස්ත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව 2023 වර්ෂයේ කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත. |

.............................................. 08.05.2023

රොෂාන් රණසිංහ (පා.ම) ........................................

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය දිනය